*සැ. යු.*- 2021.10.08 දින පළ වූ අංක 2,249 දරන *ගැසට් පත්‍රයේ* III කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 2,250 - 2021 ඔක්තෝබර් මස 15 වැනි සිකුරාදා - 2021.10.15**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම ... ... ... | 558 |
| මුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


*සැ. යු.* - (i) අකුරණ බයිතුස් සකාත් (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2021 සැප්තැම්බර් මස 24 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) දස්සනා බෞද්ධ සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2021 සැප්තැම්බර් මස 24 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(iii) විසර්ජන පනත් කෙටුම්පත 2021 සැප්තැම්බර් මස 24 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2021 නොවැම්බර් මස 05 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 ඔක්තෝබර් මස 22 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම්

## පිස්කල් වෙන්දේසියේ විකිණීමේ දැන්වීමයි

සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරමින් කොළඹ දී පවත්වනු ලබන වාණිජ මහාධිකරණයේ දී ය

පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී අංක 1161, මරදාන පාර,
කොළඹ 08.

නඩු අංක : CHC580/17/MR
ඇස්කිසි අංකය : 12/21

.......................*පැමිණිලිකරු.*

*එදිරිව*

1. මීගහමුල හේනේ නීල් රුවිර බණ්ඩාර,
අංක 257, ජෙස්මින් වත්ත,
පේරාදෙණිය.

2. මීගහමුලහේනේ පොඩිමැණිකේ,
අංක 210, දවුලගල පාර,
පැණිදෙනිය.

3. හොල්ලු පතිරගේ අමානි දීපිකා කල්දේරා,
අංක 257, ජෙස්මින් වත්ත,
පේරාදෙණිය.

.....................*විත්තිකරුවන්.*

දැනට අංක 257, ජෙස්මින් වත්ත, පේරාදෙණිය ලිපිනය පදිංචි මීගහමුල හේනේ නීල් රුවිර බණ්ඩාර යන අය වෙතටයි.

වර්ෂ 2019ක් වූ අගෝස්තු මස 09 වැනි දින ඉහත අංක දරන නඩුවේ සමථ තීන්දු ප්‍රකාශය ප්‍රකාර, එනම් වර්ෂ 2017.11.09 වැනි දිනට රුපියල් හතලිස් අට මිලියන දෙලක්ෂ හැට දෙදහස් අටසිය විසිහයයි ශත තිහක (රු. 48,262,826.30) මුදලක් සහ එකී මුදලට 2017.11.10 වන දින සිට පැමිණිල්ලේ දින එනම් 2017.12.14 දින දක්වා මසකට 4% බැගින් පොළියක් ද ඉන්පසු පැමිණිල්ලේ දින සිට එනම් 2017.11.10 වන දින සිට එකී සම්පූර්ණ මුදල මත එකී සම්පූර්ණ මුදල් ගෙවා නිම කරන දින දක්වා තීන්දු ප්‍රකාශිත මුදල මත නෛතික පොළිය ද අයකර ගැනීම සඳහා එකී 1 වන, 2 වන සහ 3 වන විත්තිකරුවන්ට එරෙහිව ඇතුළත් කරන ලද සමථ තීන්දු ප්‍රකාශය අනුව නඩු ගාස්තු ද ඉහත සඳහන් විත්තිකරුවන් විසින් පැමිණිලිකරු හට ගෙවිය යුතු බවට නියෝග කර තීන්දු ප්‍රකාශ කර ඇති බැවින් ද,

එසේම, 1 වන, 2 වන සහ 3 වන විත්තිකරුවන් විසින් සමථය ප්‍රකාර ගෙවීම් පැහැර හරින ලද හෙයින් තීන්දු ප්‍රකාශිත මුදලින්, ගෙවූ මුදල වන රුපියල් දහතර ලක්ෂ පනස් දහස් පන්සිය පහක (රු. 1,450,505.00) මුදල අඩුකොට ඉතිරි මුලු මුදල අයකර ගැනීම සඳහා 1 වන, 2 වන සහ 3 වන විත්තිකරුවන්ට එරෙහිව ඇස්කිසි ක්‍රියාත්මක කරනු ලැබ ඇත.

තවද, එකී නඩුවේ තීන්දු ප්‍රකාශය ඉටු කිරීමට එකී 1 වන, 2 වන සහ 3 වන විත්තිකරුවන් අපොහොසත් වී/පැහැර හැර ඇති හෙයින්, එකී නඩුවෙන් මා වෙත නිකුත් කර ඇති ඇස්කිසියේ බලය පිට ඉහත නම් සඳහන් 1 වන විත්තිකරු වන මීගහමුල හේනේ නීල් රුවිර බණ්ඩාර යන අයට අයත් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළෙහි හිමිකම්, අයිතිවාසිකම් හා ඊට අදාල සෑම සියලු දේ, කොළඹ වාණිජ මහාධිකරණයෙන් මා වෙත නිකුත් කරන ලද ඇස්කිසිය මත මහනුවර දිසා අධිකරණයේ රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල් වන මා විසින් වර්ෂ 2021ක් වූ ජනවාරි මස 19 වන දින, නිසිලෙස තහනම් කරන ලද පහත උපලේඛනයේ සඳහන් දේපළ,

වර්ෂ **2021ක් වූ නොවැම්බර් මස 13 වන දින පෙරවරු 10.00ට** එකී දේපල පිහිටා ඇති පැනිදෙනිය හි ම විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

දේපලට පිවිසෙන මාර්ගය,- පේරාදෙණිය නගරයේ සිට දවුලගල පාර ඔස්සේ (පැණිදෙණිය හරහා කි. මී. 1.35ක් පමණ ගොස් පැණිදෙණිය කඩවීදිය පසු කර මී. 100ක් පමණ දවුලගල දෙසට යන විට ජාතික අධ්‍යාපන ආයතනය අසලින් දකුණු පසට වන්නට ඇති පාර දිගේ ගමන් කරන විට මෙම ඉඩම හමුවේ.

*ගෙවීමේ ක්‍රමය*.- වෙන්දේසිය අවසන් වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින්, (i) ගැණුම් මිලෙන් සියයට විසිපහක් (25%) ද, (ii) සිවිල් නඩු විධාන සංග්‍රහයේ අංක 258 වගන්තිය (අ) යටතේ අයකිරීම් ද, (iii) විකුණුම් සඳහා වන සියලුම වියදම් මුදලින් ගෙවිය යුතුය. ගැණුම් මිලෙන් ඉතිරි සියයට හැත්තෑපහ (75%)ක් වූ මුදල විකිණුම් දින සිට දින තිහක් (30) ඇතුළත එකී නඩුවේ බැරට අධිකරණයේ තැන්පත් කළ යුතුයි.

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩුනුවර ගඟ පලාත, උඩනුවර ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ උඩුනුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පැණිදෙණිය අංක 21 ග්‍රාම නිලධාරි වසමෙහි පැණිදෙණිය පිහිටි රෝස්හිල් එස්ටේට් නමැති ඉඩමට වර්ෂ 1996.02.19 වැනි දින සී. ඩී. ආදිහෙට්ටි අවසරලත් මිනින්දෝරු මහතා විසින් මැන බෙද වෙන් කරන ලද අංක 1980 දරන පිඹුරේ කැබලි අංක 1 දරන පර්චස් දහතුනයි දශම පහයි බින්දුව අක්. 00, රූ. 00, පර්. 13.50 හෙවත් හෙක්ටයාර් බින්දුවයි දශම බින්දුවයි තුනයි හතරයි එකක් (0.0341) විශාලත්වය ඇති ඉඩම් කොටසට එකී පිඹුර ප්‍රකාරව මායිම්,

උතුරට : නානු ඔයද,
නැගෙනහිරට : රෝස්හිල් එස්ටේට් හි ඉතිරි කොටස ද,
දකුණට : දවුලගල සිට පේරාදෙණියට යන ප්‍රධාන පාර ද,
බස්නාහිරට : අවසරලත් මිනින්දෝරු පී. එම්. පී. මුණසිංහ මහතාගේ අංක 1427 දරන පිඹුරේ කැබලි අංක 02 දරන කොටස ද,

යන මෙකී මායිම් තුළ පිහිටි ඉඩම, ගොඩනැගිල්ල සහ එහි පිහිටි සෑම සියලු දේ ද සමග වේ.
ඉහත සඳහන් ඉඩම මහනුවර ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක සී 502/136 දරන පත් ඉරුවෙහි ලියාපදිංචි වී ඇත.

අජන්තා උඩුවෙල,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය,
මහනුවර.

2021ක් වූ ඔක්තෝබර් මස 05 වැනි දින දී ය.

10-321